# <u>නිවේදනයයි</u>

## ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

### <u>මෝටර් වාහනයක රක්ෂණ වන්දි හිමිකම්පෑමකදී අදාල වන "විරෝධතා නොමැති බව ප්‍රකාශ කිරීමේ ලිපිය" (No–Objection letter) සම්බන්ධව</u>

කුලීපිට ගැනීමේ/ කල්බදු ගිවිසුම්වලට (Hire purchase/lease agreement) යටත් වන මෝටර් වාහනයකට සිදුවන හානිය, පූර්ණ හානියක් නොවන අවස්ථාවකදී (Partial Loss), අදාල රක්ෂණ වන්දිය (Insurance Claim) රක්ෂණ ඔප්පුහිමියාට ලබාදිය යුතු බව මෝටර් වාහන රක්ෂණ ගිවිසුම්වල සඳහන් වේ.

රක්ෂණ වන්දිය ලබාගැනීම සඳහා අදාල මූල්‍ය සමාගම් වලින් "විරෝධතා නොමැති බව ප්‍රකාශ කිරීමේ ලිපියක්" (No-objection letter) ඉදිරිපත් කරන ලෙස රක්ෂණ සමාගම් විසින් ඇතැම්විට රක්ෂණ ඔප්පුහිමියන්ට අනිවාර්ය කරන බව අප වෙත දැනුම් දී ඇත.

එසේ රක්ෂණ වන්දිය ගෙවීම සඳහා අදාල මූල්‍ය සමාගමෙන් "විරෝධතා නොමැති බව ප්‍රකාශ කිරීමේ ලිපියක්" රක්ෂණ ඔප්පුහිමියන් වෙතින් ලබාගැනීම සිදු නොකළ යුතු බවට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් සියලුම රක්ෂණ සමාගම් දැනුවත් කර ඇත.